පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : : චිත්‍ර කලාව

සතිය : නව වන සතිය

සකස් කිරීම : D.P.එපිටවත්ත මිය

මාවනැල්ල අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය : 6

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතාව 4.0 : නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම 4.2 : ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය භාවිත කරයි.

ක්‍රියාකාරකම 4.2.2 ආගමික උත්සවයක් පදනම් කරගෙන සුබ පැතුම්පතක් නිර්මාණය කරන්න

කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි.

- සපයාගතයුතු ද්‍රව්‍යයන් :
- බ්‍රිස්ටල් බෝර්ඩ් හා සුදුසු ඝනකම් කඩදාසි
- පෝස්ටර් සායම්, ෆැබ්රික් සායම්
- කෙඳි සිරස්ව ඇති දත් බුරුසුවක්, හිස පීරන පනාවක්
- පේපර් කටර්, ඇමුණුම් කටු, පින්සල් හා ජ්‍යාමිතික උපකරණ
- වර්ණ ,ඩ්‍රෝවින් කඩදාසි පැන්සල් 2B/ 4B වර්ගයේ පැන්සල් ,චිත්‍ර අඳින කඩදාසි ,චිත්‍ර ඇඳීමේ පුවරු

## ක්‍රියාකාරකම

- විවිධ ආරාධනා පත්‍ර හොඳින් නිරීක්ෂණය කරන්න.
- අවශ්‍යතාවට ගැළපෙන ලෙස රූප සටහන්, සංකේත හා අක්ෂර යොදා ඇති ආකාරය අවබෝධ කරගන්න.
- ඝනකම් ඩ්‍රොවින් කඩදාසිය මත ඔබ නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන ආරාධනා පත්‍රයේ ඉදිරිපස හා පසුපස ද සටහන් කර සුදුසු ප්‍රමාණයට සීමා/රේඛා ඇඳ සැලසුම් කරන්න.
- එම නිර්මාණයට බ්‍රිස්ටල් බෝර්ඩ් එක හා දළ රේඛා සටහන් ඇඳීමට භාවිත කරන කඩදාසිය මත සීමා/රේඛා ඇඳ සලකුණු කරන්න.
- ක්‍රීඩා උත්සවයකට ගැළපෙන පරිදි, රූප හැඩතල, සංකේත හා වැකි යොදා දළ රේඛා චිත්‍රය අඳින්න.
- බ්‍රිස්ටල් බෝර්ඩ් එක කපා ඉවත් කර එය මත දළ රේඛා සටහන තබා අවශ්‍ය රූප හා සංකේත පිටපත් කරන්න. (සිදුරු තහඩු මුද්‍රණය සඳහා සටහන් අඳින විට හැඩතල වෙන් නොවන සේ කපා
- ගැනීමට හැකිවන පරිදි ආධාරක තීරු සහිතව රූප සටහන් අඳින්න ඝනකම් කඩදාසි .ඒ සඳහා දළ සටහන් හා නිදර්ශන චිත්‍ර භාවිතා කරන්න ඒවා නිර්මාණය කර උචිත වර්ණ ගන්වන්න.

❖ 4.2.2 ආගමික උත්සවයක් පදනම් කරගෙන සුබ පැතුම්පතක් නිර්මාණය කරන්න


Merry Christmas